# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2319/36 - 2023 පෙබරවාරි මස 14 වැනි අඟහරුවාදා - 2023.02.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත**

2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනතේ 38 වන වගන්තිය සමග කියවිය යුතු 16(6) වන වගන්තිය යටතේ වාරිමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**රොෂාන් රණසිංහ,**
වාරිමාර්ග අමාත්‍ය.

2023 ජනවාරි මස 15 වන දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග ඉංජිනේරුවරුන්ගේ වෘත්තියට අදාළ වෘත්තීය විෂමාචාර නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝගවලින් ඉදිරිපත් කරන සහ ප්‍රකාශිත යම් ක්‍රියාවන් හෝ නොකර හැරීම් යම් ඉංජිනේරුවරයකු විසින් සිදුකර තිබෙන විටක, ඉංජිනේරුවරුන්ගේ සභාව විසින් සිදු කරන හෝ එකී සභාව විසින් එසේ කිරීමට බලය ලබා දෙන ලද ඔවුන්ගේ විනය කමිටුවක් හෝ විනය මණ්ඩලයක් විසින් සිදු කරන විනය පරීක්ෂණයකට යටත් කරනු ලැබේ.

3. ඉංජිනේරු වෘත්තිකයකුගේ වෘත්තීය විෂමාචාර ක්‍රියාවක් යන්නෙන් -

(I) ඉංජිනේරු වෘත්තිකයකු ලෙස වෘත්තීය කටයුතු ඉටු කරන අතරතුර දී ව්‍යවස්ථාදායකය විසින්, සම්මත කළ ශ්‍රී ලංකාවේ යම් නීතියක් උල්ලංඝනය කිරීමට බලපාන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදුකිරීම;

(II) ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස වෘත්තීය කටයුතු ඉටු කරන අතරතුර දී ශ්‍රී ලංකා රජයේ යම් ලිඛිත ප්‍රතිපත්තියක් සහ නියෝගයක් උල්ලංඝනය කිරීමට බලපාන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදුකිරීම;

(III) ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස වෘත්තීය කටයුතු ඉටු කරන අතරතුර දී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අත්සන් තබා ඇති සහ පාර්ශවකරුවකු වී ඇති ලිඛිත ගිවිසුමක් හෝ ප්‍රකාශනයක් උල්ලංඝනය කිරීමට බලපාන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදුකිරීම;


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(IV) ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස වෘත්තීය කටයුතු ඉටු කරන අතරතුර දී ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව විසින් කලින් කලට සම්මත කරන සහ හඳුන්වා දෙන රීති සහ ආචාරධර්ම සංග්‍රහය උල්ලංඝනය කිරීමට බලපාන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදුකිරීම;

(V) ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස වෘත්තීය කටයුතු ඉටු කරන අතරතුර දී ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස නිසියාකාරයෙන් වෘත්තීය කටයුතු ඉටු නොකිරීමට සහ අවංකභාවයට බලපාන යම් ක්‍රියාවක් සිතාමාතාම සිදුනොකිරීම හෝ චේතනාත්මක වෘත්තීය නොකර හැරීමක් සිදුකිරීම;

(VI) ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස වෘත්තීය කටයුතු ඉටු කරන අතරතුර දී සාපරාධී වරදකට හෝ සිවිල් අලාභානියකට බලපාන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදුකිරීම;

(VII) ඉංජිනේරු වෘත්තිකයෙකු ලෙස වෘත්තීය කටයුතු ඉටු කරන අතරතුර දී වෘත්තිය වගකීම් පැහැර හැරීම හේතුවෙන් ප්‍රමාණවත් සහ අවශ්‍ය තරම් අවධානය යොමු කිරීමට අපොහොසත් වන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සිදුකිරීම;

(VIII) ඉංජිනේරු වෘත්තියේ අවංකභාවයට සහ කීර්තියට හානියක් වන අයහපත් ගුණාංග නිරූපණය කෙරෙන චේතනාන්විත හැසිරීමක් හෝ එලෙස නිරූපණය වන චේතනාන්විත නොකර හැරීමක් සිදුකිරීම.

**වෘත්තීය ඉංජිනේරුවරයෙකු විසින් මෙම නියෝගවල අංක 4 වන, 5 වන සහ 6 වන නියෝග උල්ලංඝනය කිරීම ද වෘත්තීය විෂමාචාරයකට හේතු වේ.**

4. ඉංජිනේරු වෘත්තිකයන් විසින් ඔවුන්ට පවරන ලද සහ විශේෂයෙන් ඔවුන් සුදුසුකම් ලත් වැඩ සහ කාර්යයන් පමණක් භාර ගත යුතු ය.

5. ඉංජිනේරු වෘත්තිකයන් විසින් අනුගමනය කළ යුතු සියලු ආකාරයේ මාර්ගෝපදේශ, නියෝග, සැලසුම් සහ ඉටු කරන ආකාරයන් ලියවිල්ලකින් දැක්විය යුතු ය.

6. ඉංජිනේරු වෘත්තිකයෙකු විසින් සම්මත කරන සියලු ආකාරයේ මාර්ගෝපදේශ, නියෝග, සැලසුම් සහ ඉටු කරන ආකාරය ලියවිල්ලකින් දැක්විය යුතු ය.

7. ඉංජිනේරු වෘත්තිකයකු සිය වෘත්තිය ඉටු කිරීමේ දී යම් තැනැත්තකු වෙත හෝ වෘත්තිය කටයුතු වෙත සාධාරණ ලෙස යොමු කළ යුතුව ඇති, අවශ්‍ය අවධානය ලබා දීමට අපොහොසත් වේ නම් එය ඔහුගේ වෘත්තිය ඉටු කිරීමේ දී වෘත්තිය විෂමාචාරයකට හේතු වේ.

*වැඩිදුරටත් සභාව වෙත පැවරෙන බලතල*

8. ආරවුල් උද්ගත වන නිශ්චිත ඉංජිනේරු ක්ෂේත්‍රයක් තුළ වෘත්තීය විෂමාචාරයක් සිදු වන්නේ ද නැද්ද යන්න පිළිබඳ සිද්ධියක්, ක්‍රියාවක් හෝ කිසියම් නොකර හැරීමක් එකිනෙකට පරීක්ෂා කිරීමට විශේෂඥ දැනුමකින් යුතු ඉංජිනේරුවරුන්ගේ සභාවට මෙයින් බලය පැවරී ඇත.

9. විශේෂඥ සාක්ෂිවලට අදාළ වන සාක්ෂි නීතියේ සහය ලබා ගැනීමේ දී ( ශ්‍රී ලංකා සාක්ෂි ආඥාපනතේ 45 වගන්තිය යටතේ) නිශ්චිත ගැටළුවකට එය අදාළ වන තාක් දුරට එය සහාය කර ගැනීමට ඉංජිනේරුවරුන්ගේ සභාවට නිදහස ඇත.

10. මෙම නියෝග උල්ලංඝනය කරන ඉංජිනේරු වෘත්තිකයකු ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව විසින් කලින් කලට සම්මත කරන විනය කාර්ය පටිපාටිය මගින් පාලනය කළ යුතු වේ.

11. මෙම නියෝගවල :-

පනත යනුවෙන්, 2017 අංක 4 දරන ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාව පනත අදහස් වේ.

"ඉංජිනේරුවරුන්ගේ සභාව" හෝ "සභාව" හෝ "ශ්‍රී ලංකා ඉංජිනේරු සභාව" *නැතහොත්* "ශ්‍රී ලංකාවේ ඉංජිනේරුවරුන්ගේ සභාව" යනුවෙන්, 2017 අංක 4 දරන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවට කරන හැඳින්වීම් ලෙස අදහස් වේ.

EOG 02 - 0143

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.